සැ. යු. - 2021.01.15 දින අංක 2,211 දරන ගැසට් පත්‍රයේ I : III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,212 - 2021 ජනවාරි මස 22 වැනි සිකුරාදා - 2021.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 2 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 පෙබරවාරි මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 - B 82098 — 5,403 (2021/01)

# පළාත් පාලන නිවේදන

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

## දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව පිටබැද්දර ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛනයේ ඇතුළත් A සිට D දක්වා ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශ ලෙස, මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් විසින්, ඔහුගේ අංක මාර/පපසකො/සං/08/02-11/2020 හා 2020.11.19 දිනැති ලිපිය මගින් අනුමත කොට ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

**A ප්‍රදේශය**

මොරවක මිල්ලඇල මංසන්දියේ සිට අකුරැස්ස දෙසට රඹුකන පාලම දක්වා වූ 3KM 400M දුරැති දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට නැගෙනහිරින් නිල්වලා ගඟ දක්වා පිහිටි නිශ්චිත දේපළ ද, බටහිරින් 75M දක්වා පිහිටි නිශ්චල දේපළ ඇතුළත් ප්‍රදේශය.

**B ප්‍රදේශය**

මොරවක නෙළුව මාර්ගය ආරම්භයේ සිට නෙළුව දෙසට, මොරවක පොදු ක්‍රීඩාංගනයට පිවිසුම් මාර්ගය දක්වා වූ 300M දුරැති මොරවක නෙළුව මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට උතුරින් 75M දක්වා පිහිටි නිශ්චල දේපළ ද, දකුණින් 75M දක්වා පිහිටි නිශ්චල දේපළ ඇතුළත් ප්‍රදේශය.

**C ප්‍රදේශය**

පිටබැද්දර නාත්තවිල හන්දියේ සිට අකුරැස්ස දෙසට මල්පුදනැල්ල හන්දිය දක්වා වූ 1KM 800M දුරැති දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට නැගෙනහිරින් 75M දක්වා පිහිටි නිශ්චිත දේපළ ද, බටහිරින් 75M දක්වා පිහිටි නිශ්චල දේපළ ඇතුළත් ප්‍රදේශය.

**D ප්‍රදේශය**

පිටබැද්දර සියඹලාගොඩ මාර්ගය ආර්මිභයේ සිට දංකොළුව හන්දියෙන් වමට දිවෙන මාර්ගයේ දංකොළුව බෝධිය දක්වා වූ 900M දුරැති පිටබැද්දර පස්ගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට නැගෙනහිරින් 75M දක්වා පිහිටි නිශ්චිත දේපළ හා ඒ මාර්ගය හා සම්බන්ධ සියලු අතුරු මාර්ගයන්හි වම් පස හා දකුණු පස 50M පිහිටි සියලුම නිශ්චිත දේපළද, බටහිරින් පිටබැද්දර පස්ගොඩ මාර්ග යේ 75M දක්වා පිහිටි නිශ්චිත දේපළ හා ඒ මාර්ගය හා සම්බන්ධ සියලු අතුරු මාර්ගයන්හි වම්පස හා දකුණු පස 50M පිහිටි සියලුම නිශ්චිත දේපළ ඇතුළත් ප්‍රදේශය.

රුබසිං ශ්‍රී වර්ධන මහින්දපාල,
සභාපති,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2021 ජනවාරි මස 07 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ දී ය.

01-528

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.